# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ඇබෑර්තු

වෛද්‍ය ආඥා පනත (105 අධිකාරිය) මගින් ස්ථාපිත ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ශ්‍රී ලංකාවේ වෛද්‍ය, දන්ත සහ අනෙකුත් සෞඛ්‍යරක්ෂණ වෘත්තිකයින් සඳහා වන නියාමන මණ්ඩලය වන අතර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පහත සඳහන් ඒකක පවත්වාගෙන යාමේ අභියෝගය භාර ගැනීමට කැමති පළපුරුදු හා ක්‍රියාශීලී වෘත්තිකයින්ගේ සේවය බලාපොරොත්තු වේ.

## 1. විදේශ උපාධි ඒකකයේ ප්‍රධානී

**සුදුසුකම් :**

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥයකු වශයෙන් ලියාපදිංචි වීම.
- වෛද්‍ය අධ්‍යාපනයේ සහ / හෝ උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම / තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය පිළිබඳ අවුතරමින් වසර 15 ක පළපුරුද්ද සනාථ කළ අතීත ජයග්‍රහණ

**රාජකාරී සහ වගකීම් :**

- විදේශීය විශ්වවිද්‍යාල මගින් වෛද්‍ය හා දන්ත උපාධි වැඩසටහන් පිළිගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් ඇගැයීම.
- විදේශීය විශ්වවිද්‍යාලවල වෛද්‍ය හා දන්ත උපාධිධාරීන් විසින් ඔවුන්ගේ උපාධි අනුමත කරන ලෙස ඉදිරිපත් කරන අයදුම්පත් ඇගැයීම.
- 67A වගන්තිය යටතේ තාවකාලික ලියාපදිංචි කිරීම් පිණිස සහ අමතර සුදුසුකම් ලියාපදිංචි කරන ලෙස වෘත්තිකයින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඇගයීම.
- ඉහත ඒකකයට අදාළ විවිධ මණ්ඩල හා කමිටු රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.
- මාතව සම්පත් කළමනාකරණය ඇතුළු ඒකකයේ සාමාන්‍ය පරිපාලනය.

## 2. සම සෞඛ්‍ය ඒකකයේ ප්‍රධානී

**සුදුසුකම් :**

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥයකු ලෙස ලියාපදිංචි වීම.
- වෛද්‍ය / දන්ත හෝ සෞඛ්‍ය හෝ සෞඛ්‍යාරක්ෂණ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවුතරමින් වසර 15 ක පළපුරුද්ද

**රාජකාරී සහ වගකීම් :**

- සෞඛ්‍ය වෘත්තිකයින්ගේ සම සෞඛ්‍ය කන්ඩායම් පිළිබඳ ලියාපදිංචි ක්‍රියා පටිපාටිය පාලනය කිරීම.
- මාතව සම්පත් කළමනාකරණය ඇතුළු ඒකකයේ සාමාන්‍ය පරිපාලනය.

## 3. ප්‍රතීතන ඒකකයේ ප්‍රධානී

**සුදුසුකම් :**

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥයකු ලෙස ලියාපදිංචි වීම.
- වෛද්‍ය අධ්‍යාපනය සහ / හෝ උසස් අධ්‍යාපනය පිළිබඳ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතනය පිළිබඳ අවුතරමින් වසර 10 ක පළපුරුද්ද.

**රාජකාරී සහ වගකීම් :**

- ශ්‍රී ලංකාවේ වෛද්‍ය හා දන්ත පාසල් වලින් පිරිනමන මූලික වෛද්‍ය සහ දන්ත උපාධි ප්‍රතීතනය සඳහා වගවීම.
- විදේශීය වෛද්‍ය හා දන්ත පාසල් මගින් පිරිනමන මූලික වෛද්‍ය හා දන්ත උපාධි පිළිගැනීමෙහිලා සම්බන්ධ ක්‍රියාදාමය සඳහා වගවීම.
- මාතව සම්පත් කළමනාකරණය ඇතුළු ඒකකයේ සාමාන්‍ය පරිපාලනය.

## 4. නීති ඒකකයේ ප්‍රධානී

**සුදුසුකම් :**

- ජනාධිපති නීතිඥයකු වීම හෝ මහාධිකරණයේ හෝ මහාධිකරණ මට්ටමට ඉහළ උසාවියක විශ්‍රාමික විනිසුරුවරයකු වීම.
- නීතිය පිළිබඳ නීති වේදී උපාධිය / නීති ආචාර්ය උපාධිය සහ / හෝ වෙනත් පශ්චාත් උපාධි ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- ප්‍රබල අන්තර් පුද්ගල හා සමාජ නිපුණතා සහිත සාමූහික කණ්ඩායම් සාමාජිකයකු වීම.
- රැකියාවට දැඩි කැපවීමක් සහිත විනයගරුක හා ප්‍රියජනක පෞරුෂත්වයක් සහිත අයකු වීම.

**රාජකාරී සහ වගකීම් :**

- කලින් කලට පැන නගින නෛතික කරුණු මත සභාවට උපදෙස් දීම හා මගපෙන්වීම.
- නීති ඒකකයේ නීති / අභිචෝදන නිලධාරීන් වෙත නෛතික කරුණු පිළිබඳව සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම හා මගපෙන්වීම.
- නීතිපති දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් අනුමත කළ පෞද්ගලික නීතිඥවරුන් විසින් භාරගනු ලැබූ නෛතික කරුණු පිළිබඳව මග පෙන්වීම.
- මාතව සම්පත් කළමනාකරණය ඇතුළු ඒකකයේ සාමාන්‍ය පරිපාලනය.

**පොදු කොන්දේසි :**

**වයස** : අවුරුදු 67 ට අඩු විය යුතුය.

**වැටුප** : වැටුප සහ අනෙකුත් ප්‍රතිලාභ වෛද්‍ය සභාව මගින් නිශ්චය කර ඇති පරිදි වේ.

**රැකියා නියුක්තියේ කොන්දේසි :**

දෙවන වාරයකටත් නැවත පත් කිරීමේ හැකියාව සහිත වසර තුනක කාලයක් සඳහා මෙම පත්වීම පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.

**අයදුම්කරණ පිළිවෙළ :**

අයදුම්කරු තම සම්පූර්ණ ජීව දත්ත, තනතුර සඳහා ඔහුගේ / ඇයගේ යෝග්‍යතාව පැහැදිලි කෙරෙන ආවරණ ලිපියක් (අයදුම්කරු රාජ්‍ය අංශයේ සේවය කරන්නේ නම්, එම නිලධාරියා තෝරා ගනු ලැබුවහොත්, ඔහු / ඇය මුදාහැරිය හැකි බව සහතික කෙරෙන ලිපියක් අදාළ ආයතන ප්‍රධානී මගින්) සමග 2024 මාර්තු 05 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය. නැතහොත් පහත දැක්වෙන විද්‍යුත් තැපැලට යොමු කළ යුතුය.

විශේෂ සටහන : තෝරාගනු ලබන අයදුම්කරුවන්ට තනතුරුවල විස්තරාත්මක වගකීම් හා රාජකාරී ලැබෙන්නට සළස්වනු ඇත.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
registrar@slmc.gov.lk

**2024 පෙබරවාරි 11.**